**බුද්ධිමය දේපළ අරමුදල - 2016**

**-----------------------------------------------**

බුද්ධිමය දේපළ අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 176 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බුද්ධිමය දේපළ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයවේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව කාර්යසාධන ප්‍රකාශනය සැකසීමේදී වර්ෂයේ වියදම් වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව අරමුදලේ වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 23 දින මුහුණත අගය රු.13,993,000 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවල රු.14,369,104 ක් ආයෝජනය කර තිබුණු අතර ඒ සඳහා 2017 ජනවාරි 02 දිනට ලැබිය යුතු රු.741,629 ක කූපන් අගයෙන් සමාලෝචිත වර්ෂයට අදාල වටිනාකම රු.667,466 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.32,961 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල පොලිය රු.634,505 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී සංචාරක ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලද බුද්ධිමය දේපල ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අතරමගදී නවතා දැමීමට සිදුවී තිබුණි. එම ඉදිකිරීම් වෙනුවෙන් වැය කරන ලද රු.22,298,751 ක මුදල 2009 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ යටතේ පැවතියදී සහ අදාල වත්කම් අධිකාරියට පවරා ගැනීමේ කටයුතු කෙරෙමින් පැවතියදී ස්ථාවර වත්කමක් ලෙස 2013 වර්ෂයේ සිට ප්‍රාග්ධනිත කර 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාර්ෂිකව සියයට 5 බැගින් රු.3,344,813 ක් ක්ෂය කර තිබුණි. ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබූ රු.22,298,751 ක මුදල අයකර ගැනීමට නියමිත වුවත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව වෙනත් ආදායම් රු.673,843 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 03 අනුව එය රු.835,821 ක් වීමෙන් රු.161,978 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ලැබීම් හා ගෙවීම් ගිණුමෙහි වෙනත් ලැබීම් ලෙස රු.1,511,452 ක් දක්වා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව එය රු.1,695,869 ක් වීමෙන් රු.184,417 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මාසික කුලී ගෙවීම් වියදම වැය ලෙජරය අනුව රු.2,575,000 ක් වූ අතර පොදු ලෙජරය අනුව එම වියදම රු. 2,400,000 ක් වූයෙන් රු.175,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.60,154,755 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.48,032,685 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,122,070 කින් වර්ධනය වී තිබුණි. ආයෝජන පොලී ආදායම රු.11,355,425 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් ඇතිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.51,278,754 ක් වූ දායකත්වය අඛණ්ඩව වැඩි වී 2014 වර්ෂයේදී රු.57,474,118 ක් වී තිබුණද 2015 වර්ෂයේදී රු.54,204,728 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද 2016 වර්ෂයේදී රු.67,694,524 ක් දක්වා නැවත වර්ධනය වී තිබුණි.

### 3.2 අරමුදලට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර පාර්ශව 11 ක් විසින් පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් බලපත්‍ර ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අරමුදලට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ජාතියේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම, වෙළඳාමට පහසුකම් සැලසීම සහ මනා ලෙස ක්‍රමානුකූල කිරීම, ආයෝජන වැඩි කිරීම, පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ දැනුම මුල්කරගත් ගෝලීය ආර්ථික ක්‍රියාකාරිත්වයට ජාතික ආර්ථිකය ඒකාබද්ධ කිරීම යනාදිය අරමුණු කරගනිමින් බුද්ධිමය දේපල කාර්යාලය විසින් අරමුදල ස්ථාපිත කර තිබුණි. එකී අරමුණු ඉටු කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්ගේ කාර්යසාධනය පහත පරිදි විය.

### 4.1.1 වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම

| | වෙළඳ ලකුණු ලියාපදිංචිය | | පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය | | කාර්මික සැලසුම් ලියාපදිංචිය | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 |
| වර්ෂය තුල ලැබුණු අයදුම් පත් ප්‍රමාණය | 10,825 | 9,415 | 574 | 481 | 382 | 457 |
| පරීක්ෂණ වාර්තා සැකසීමකළ අයදුම්පත් ප්‍රමාණය | 9,174 | 12,623 | 383 | 215 | 406 | 443 |
| ගැසට් නිවේදන පළ කළ ප්‍රමාණය | 8,517 | 5,088 | 50 | 41 | 328 | 351 |
| ලියාපදිංචි කළ ප්‍රමාණය | 3,312 | 2,272 | 124 | 263 | 341 | 246 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) වෙළඳ ලකුණු ලියාපදිංචිය**

(i) සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු සංඛ්‍යාව 3,312 ක් වූ අතර ඒ තුල 1983 සිට 2015 දක්වා ලද අයදුම්පත් ද විය. ඒ අනුව ඒවා ලියාපදිංචි කිරීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 33 දක්වා කාලයක් ගත වී තිබුණි. බුද්ධිමය දේපළ පනත අනුව වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පතක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලද දිනයේ සිටම ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර එම දිනය ලියාපදිංචි දිනය ලෙස සැලකෙන බව දැක්වේ. එලෙස එම ලකුණ වසර 10 ක් දක්වා වලංගු වන බවත් ඉන් පසු වර්ෂ 10 ක්වූ අනුගාමී කාලසීමා සඳහා ලියාපදිංචිය අළුත් කරනු ලැබිය හැකි බවත් දැක්වෙතත් වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගත වී තිබීමෙන් බොහෝ අවස්ථාවලදී ලියාපදිංචි දිනය වන විට අළුත් කිරීමේ දිනයන් ද පසුවී තිබුණු බව අනාවරණය විය.

(ii) වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා 2016 ජනවාරි 01 දිනට වැඩ ආරම්භ කර ඇති අයදුම්පත් සංඛ්‍යාව 41,718 ක් හා වැඩ ආරම්භ කර නොමැති අයදුම්පත් සංඛ්‍යාව 10,631 ක් විය. වර්ෂය තුළ අයදුම්පත් 10,825 ක් ලැබී තිබුණු අතර වර්ෂය තුළ ප්‍රතික්ෂේප හා ලියාපදිංචි කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 7,668 ක් විය. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට වෙළඳ ලකුණු ලියාපදිංචිය අවසන් කර නොමැති අයදුම්පත් සංඛ්‍යාව 55,506 ක් විය. එයින් පරීක්ෂණ කටයුතු ආරම්භ නොකළ අයදුම්පත් සංඛ්‍යාව 12,282 ක් විය.

(iii) ප්‍රමාදය වැලැක්වීම සඳහා 2013 වර්ෂයේ සිට කැලි පදනම යටතේ පරීක්ෂණ කටයුතු සිදු කෙරුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලියාපදිංචිය අවසන් නොකළ හා කටයුතු ආරම්භ නොකළ ලිපිගොනු විශාල ප්‍රමාණයක් පැවතුණි.

(ආ) **කාර්මික සැලසුම් ලියාපදිංචිය**

(i) 2016 වර්ෂය තුළ ලියාපදිංචි කර තිබූ කාර්මික සැලසුම් සංඛ්‍යාව 341 ක් වූ අතර ඒ තුළ 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ලද අයදුම්පත් විය. මේ අනුව කාර්මික සැලසුම් සඳහා වන අයදුම්පතක් ලියාපදිංචි කිරීමට මාස 10 සිට වර්ෂ 07 දක්වා වූ කාලයක් ගත වී තිබුණි.

(ii) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාර්මික සැලසුම් අයදුම්පත් 2,321 ක් ලැබී තිබුණු අතර එයින් 2016 දෙසැම්බර් 31 වන විටත් අයදුම්පත් 825 ක් සම්බන්ධයෙන් කටයුතු නිම වී නොතිබුණි.

(ඇ) **නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය**

(i) සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 124 ක් වූ අතර එහි 2001 දී ලැබී තිබුණු එක් අයදුම්පතක් හා 2006 සිට 2016 දක්වා ලද අයදුම්පත් විය. ඒ අනුව පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා මාස 09 සිට වසර 15 ක් දක්වා කාලයක් ගත වී තිබුණි. තවද පේටන්ට් බලපත්‍රයක් පරීක්ෂා කර එම අයදුම්පත්වල අඩුපාඩු අදාල පාර්ශව වෙත දන්වා යැවීමට වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා වූ කාලයක් ගත වී තිබූ බව නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ii) මෙලෙස පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා අධික කාලයක් ගතවීමෙන් නව නිපැයුම්කරුවන්ට පේටන්ට් බලපත්‍ර පිළිබඳ විශ්වාසය හා නව නිපැයුම් වාණිජකරණයේ දී පේටන්ට් බලපත්‍රයේ ඇති වැදගත්කම අඩු විය හැකි බව නිරීක්ෂණය කෙරේ.

(iii) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අයදුම්පත් 2,984 ක් ලැබී තිබුණු අතර එයින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයදුම්පත් 1,903 ක් සම්බන්ධයෙන් කටයුතු නිම වී නොතිබුණි. තවද 2016 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි කිරීම සඳහා ලද අයදුම්පත් වලින් අයදුම්පත් 85 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

### 4.1.2 තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථාන ඇති කිරීම

තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ නව නිපැයුම්කරුවන්ට, විද්‍යාඥයන්ට හා පර්යේෂකයන් වෙත තාක්ෂණික තොරතුරු සඳහා ප්‍රවේශයක් ලබා දීමේ අරමුණෙන් දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථාන 08ක් ඇති කිරීම සඳහා වර්ෂය තුල සැලසුම් කර තිබුණද එවැනි මධ්‍යස්ථාන 03 ක් පමණක් පිහිටුවා තිබුණි.

### 4.1.3 කාර්යසාධනය

කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ සැලසුම් සකස් කිරීමක් සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරම්

2008 දෙසැම්බර් මාසයේ දී අස්ථානගත වී තිබූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය සම්බන්ධ මූලික විමර්ශනයක් පමණක් සිදුකර තිබූ අතර එහිදී අදාල පාර්ශවයන්ට චෝදනා පත්‍රයක් ගොනු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව දක්වා තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ දී බුද්ධිමය දේපළ කාර්යාලයට අදාල විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් 08 දෙනෙකු සහභාගි කරවා තිබූ අතර ඒ සඳහා අනියම් දීමනා වශයෙන් රු.316,768 ක් බුද්ධිමය දේපළ අරමුදලින් වැය කර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අරමුදලේ කටයුතු සඳහා 2016 දෙසැම්බර් මාසයේදී රු.73,542 ක් වැයකර විධායක පුටුවක් හා පොත් රාක්කයක් මිලදී ගෙන තිබුණද 2017 ජුනි 20 දින වන විටත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි.

## 4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) පරිගණක හා උපාංග මිලදී ගැනීම

අරමුදලේ කටයුතු සඳහා ලැප්ටොප් පරිගණක 08 ක්, පරිගණක 31 ක්, ස්කැනර් යන්ත්‍ර 02 ක්, මුද්‍රණ යන්ත්‍ර 20 ක් හා UPS 39 ක් රු.6,023,600 කට මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 20 දින ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර 2016 දෙසැම්බර් 28 දිනට පෙර භාණ්ඩ සපයන ලෙස දන්වා තිබුණද මෙම භාණ්ඩ 2016 දෙසැම්බර් 30 දින සිට 2017 මාර්තු 27 දක්වා කාලය තුළ ලැබී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලැප්ටොප් පරිගණක හැර ඉතිරි භාණ්ඩ කාර්යාලයට ලැබීමට පෙර ඒවා පිරිවිතරවලට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු විසින් 2016 දෙසැම්බර් 28 දින සහතික කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය ප්‍රකාරව අදාල සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(iii) 2016 වර්ෂය ආරම්භයේදී මොනිටර් 77 ක්, CPU 79 ක්, UPS 74 ක්, සහ මුද්‍රණ යන්ත්‍ර 49 ක් කාර්යාලය සතුව පැවති අතර එදිනට ද්විතීයික මට්ටමේ එනම් කළමනාකරණ සහකාර දක්වා සිටි සත්‍ය සේවක සංඛ්‍යාව 48 ක් විය. එසේ තිබියදී ඉහත පරිදි පරිගණක උපාංග මිලදී ගෙන තිබුණි.

(iv) මිලදී ගන්නා ලද භාණ්ඩවලින් රු.3,028,200 ක් වටිනා මුද්‍රණ යන්ත්‍ර 04 ක්, ලැප්ටොප් පරිගණක 05 ක්, පරිගණක 18 ක් හා UPS 27 ක් 2017 ජුනි 20 වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

# 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 21 දිනදීය.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 4.2.1 (ආ), (ඇ), (ඉ) හා 4.2.2 (අ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර එකී සැලැස්ම මාස 06 කට නොවැඩි කාලයක් තුළ යාවත්කාලීන කළ යුතු බව හා ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කළ යුතු බව දක්වා ඇති නමුත් ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැය ගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 15 සිට සියයට 39 දක්වා වූ පරාසයක විචලනයක් සහ අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 99 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ස්ථාවර වත්කම් ලේඛනය සම්පූර්ණව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර වත්කම් ඉවත් කිරීම්වලදී එම වත්කම් නිවැරදිව හඳුනාගෙන වත්කම් වලින් ඉවත් කිරීම සිදු නොකිරීම. |
| (ආ) | වෙළඳ ලකුණු,පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම | කාර්යාලයට ලැබෙන අයදුම්පත් පරීක්ෂා කිරීම, ගැසට් කිරීම, ලියාපදිංචි කිරීම හා අළුත් කිරීම යනාදි කාර්යයන් වල සැලකිය යුතු ප්‍රමාදයක් පැවතීම. |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | වර්ෂය තුළ මිලදී ගැනීම් නිශ්චිත කාල සටහනකට අනුව සිදු කර නොතිබුණු අතර අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් සිදු කර නොතිබීම. |
| (ඈ) | භෞතික සම්පත් උපයෝජනය | කාර්යාලයේ භෞතික සම්පත් වඩා කාර්යක්ෂමව, ඵලදායීව හා අරපිරිමැසුම්දායකව උපයෝජනය කර නොතිබීම. |